# බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ගුරු තනතුර සඳහා දෛනික පදනමින් සුදුසුකම් සහිත අයදුම්කරුවකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2026

බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ගුරු තනතුර සඳහා දෛනික පදනමින් සුදුසුකම් ලත් අයදුම් කරුවකු බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය <u>2026.11.02</u> දින වේ.

**01. <u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>**

(අ) අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය

(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක් දකුණු පළාතේ බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2026.11.02) දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුය

**02. <u>අධ්‍යාපන සුදුසුකම්</u>**

(අ) සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් (01) හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

(ඇ) අවුරුද්දක් හෝ එයට වැඩි පෙර පාසල් ගුරු ඩිප්ලෝමාවක් හදාරා තිබීම

**03. <u>සේවා කොන්දේසි</u>**

(අ) මෙය දෛනික පදනමින් කරනු ලබන පත්වීමක් වන අතර බෙන්තොට ප්‍රාදේශීය සභාවේ කිසිදු ස්ථිර තනතුරක් සඳහා සුදුසුකම් හිමිවීමක් මෙ මගින් සිදු නොවේ

(ආ) මෙම තනතුරට දෛනික වැටුපක් ගෙවනු ලබන අතර එය රු. 1,507.67 කි. සේවයේ යෙදුනු දිනයන්ට අදාලව ගෙවීම කරනු ලබයි.

<u>04. අයදුම් කරුවන්ට පොදු උපදෙස්</u>

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් හා අදාල ලිපි ලේඛන පරීක්ෂාකර බලා මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ඉල්ලුම් කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනේ.

  ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන් මේ සමග පල කරන ආදර්ශ අයදුම් පත අනුව සකස් කර ගත් අයදුම්පතක් තමන් විසින්ම සම්පූර්ණ කර, ජීව දත්ත පත්‍රිකාවක් හා ඉහත සුදුසු කම් සනාථ කරන ලේඛන වල ඡායා පිටපත් කට්ටලයක් ද සමග 2026.11.02 දින හෝ එයට පෙර ***ලේකම්, ප්‍රාදේශීය සභාව, බෙන්තොට*** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර තෝරා ගන්නා අයදුම්කරුවන්ට පමණක් ලිඛිතව ඒ පිළිබඳව දැනුවත් කෙරේ.

- තෝරා ගනු ලබන අයදුම්කරු සේවයට වාර්තා කිරීමෙන් පසු 2026.12.31 දින දක්වා පමණක් ලියාපදිංචි කර සේවයේ යෙදවනු ලැබේ.

සභාපති,

බෙන්තොට ප්‍රාදේශීය සභාව, බෙන්තොට (☎ 034 2275419)

## ආදර්ශ අයදුම් පත්‍රය

## බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ගුරු පුරප්පාඩුව සඳහා දෛනික පදනමින් සුදුසුකම් සහිත අයදුම්කරුවකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2026

1

1.1. මුල් අකුරු සමඟ නම ( සිංහලෙන්) : Rev/Mr/Mrs/Miss ........................................................................................

1.2. මුල් අකුරු සමඟ නම ( ඉංග්‍රීසියෙන්) ........................................................................................

1.3. මුල් අකුරු වලින් හැඳින්වෙන නම : ........................................................................................

1.4. සම්පූර්ණ නම (සිංහලෙන්) ........................................................................................

1.5. ස්ත්‍රී පුරුෂ භාවය ............................................

1.6. විවාහක/අවිවාහක බව ..................................

1.7. ස්ථිර ලිපිනය ........................................................................................

1.8. දුරකථන අංකය (ජංගම) ................................ ( ස්ථාවර) ............................

1.9. උපන් දිනය (YYYY/MM/DD) .................................. 2026.11.02 දිනට වයස අවුරුදු ............මාස ..........දින .......

1.10. ජාතික හැඳුනුම්පත් අංකය ............................................................

1.11.ජන වර්ගය ................................ ආගම ..............................

2.

2.1. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

- විභාගය පැවැත්වූ වර්ෂය:
- විභාග අංකය :
- ප්‍රතිඵල

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

3.

3.1. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර

- විභාගය පැවැත්වූ වර්ෂය:
- විභාග අංකය :
- ප්‍රතිඵල

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 3 | |
| 2 | | 4 | |

4.

4.1 පෙර පාසල් ගුරු ඩිප්ලෝමාව පිළිබඳ විස්තරය:

- ඩිප්ලෝමාව
- ආයතනයේ නම
- ඩිප්ලෝමාව වලංගු වන දිනය
- ඩිප්ලෝමා කාල සීමාව

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් ඉහත සපයන ලද තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරාගැනීමට මා එකඟ වෙමි. මා විසින් සිදු කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය බවට ඔප්පු වුවහොත් පත් කිරීමට පෙර නුසුදුස්සෙකු වන බවට හා පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දන්වමි. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.............................  ..........................................................

දිනය  අයදුම්කරුගේ අත්සන